# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,125- 2019 මැයි මස 24 වැනි සිකුරාදා - 2019.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1042 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - පළාත් සභා (සංශෝධන) පනත් කෙටුම්පත 2019 මැයි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජූනි මස 14 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මැයි මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1041 - B 81526— 5,403 (2019/05)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## ආණ්ඩුකාරවර කාර්යාලය - වයඹ පළාත

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් සේවයේ පළාත් ආදායම් කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම - 2019

(විධායක නිලධාරි සේවා ගණය - I ශ්‍රේණිය)

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් කොමසාරිස් තනතුර සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *තනතුරු නාමය :* පළාත් ආදායම් කොමසාරිස් (විධායක නිලධාරි සේවා ගණය - 1 ශ්‍රේණිය)

02. *සේවා කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

ii. රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I වන කොටසේ II 'අ' කොටසේ ඇතුළත් පොදු කොන්දේසිවලට යටත් විය යුතුය.

03. වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය : SL1-2016

රු. 47,615, 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 1,10,895 එසේ වුවත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි පරිදි වැටුප ගෙවනු ලැබේ.

04. *සුදුසුකම් :*

විධායක නිලධාරි සේවා ගණයේ 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, විධායක නිලධාරි සේවා ගණයේ මුළු සේවා කාලය වසර 20 ක් තිබිය යුතු වේ. ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්නයෙන් වසර 05 ක් සක්‍රීය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් අතරින් සුදුසු නිලධාරියෙකු පළාත් ආදායම් කොමසාරිස් තනතුරට පත්කරනු ලැබේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශය මත සුදුසුකම් ලබන අයකු පත්කරනු ලැබේ.

06. *සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමවේදය :*

| | | |
|---|---|---|
| 01 | විධායක නිලධාරි සේවා ගණයේ නිලධාරියෙකු වශයෙන් වසර 20 කට වැඩි සේවා කාලයක් සඳහා එක් වසරකට ලකුණු 03 බැගින් | උපරිම ලකුණු 30 |
| 02 | ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් අනුව, | උපරිම ලකුණු 15 |
| | i. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා (විෂයට අදාළව) - ලකුණු 10 | |
| | ii. පශ්චාත් උපාධියක් සඳහා (විෂයට අදාළව) - ලකුණු 15<br>(ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | |
| | iii. ඉංග්‍රීසි භාෂාව සඳහා මාස 06 කට නොඅඩු ඩිප්ලෝමාවක් සඳහා | ලකුණු 10 |

| | | |
|---|---|---|
| | iv. පරිගණක හැකියාව (මාස 06 කට නොඅඩු පාඨමාලාවක් සඳහා) | ලකුණු 10 |
| 03 | විධායක නිලධාරි සේවා ගණයේ I පන්තියේ සේවය කර ඇති සේවා කාලය වෙනුවෙන් අයදුම්පත් කැඳවන දිනට,<br>වසරකට ලකුණු 1 1/2 බැගින්, සහ<br>වසරකට අඩු මාස 06කට වැඩි සේවා කාලයකට - ලකුණු 01 බැගින් | උපරිම ලකුණු 15 |
| 04 | වයඹ පළාත් ආදායම් සේවයේ සේවය කළ කාලයට,<br>(එක් වසරකට ලකුණු 01 බැගින්) | උපරිම ලකුණු 05 |
| 05 | ආදායම් සේවාවේ කර ඇති විශේෂ ව්‍යාපෘති සඳහා ලිඛිත ලේඛන තම විෂය පථයට අදාලව, | උපරිම ලකුණු 10 |
| | (i) ප්‍රසිද්ධ පුවත් පතක පළකරන ලද ලිපි සඳහා (ලකුණු 02 බැගින්) | |
| | (ii) වාර සඟරාවක පළකරන ලද ලිපියකට (ලකුණු 03 බැගින්) | |
| | (iii) සමුළුවක දී ඉදිරිපත් කරන ලද නිබන්ධනයකට (ලකුණු 05 බැගින්) | |
| 06 | ඉදිරිපත්වීමේ හැකියාව හා පෞරුෂය සඳහා | ලකුණු 05 |
| | **මුළු ලකුණු සංඛ්‍යාව** | **ලකුණු 100 කි.** |

07. *අයදුම් කළ යුතු ආකාරය :*

ආදර්ශ ආකෘතිය ප්‍රකාර සකස් කර ගන්නා ඉල්ලුම් පත 2019.06.14 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ වයඹ ආණ්ඩුකාරවර "**ලේකම්, වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය, මාළිගාව, කුරුණෑගල**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "**වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් ආදායම් කොමසාරිස් තනතුර සඳහා අයදුම්පත**" යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත සමග විධායක නිලධාරි සේවා ගණයට පත්කරන ලද පත්වීම් ලිපියේ හා I ශ්‍රේණියට උසස්වීම් ලද ලිපියේ සහතික කළ පිටපතක් එවිය යුතුය.

08. අසම්පූර්ණ හා අවිධිමත් ඉල්ලුම්පත්‍ර කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය පරිදි,

එන්. පී. එම්. කාරියවසම්,<br>
වයඹ ආණ්ඩුකාරවර ලේකම්.

වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය,<br>
මාළිගාව,<br>
කුරුණෑගල.<br>
2019 මැයි මස 24 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් සේවයේ පළාත් ආදායම් කොමසාරිස් සඳහා බඳවා ගැනීම - 2019***

*(විධායක නිලධාරි සේවා ගණය 1 ශ්‍රේණිය)*

01. නිලධාරියාගේ නම :

i. මුලකුරු සමග නම :...............................................................................................
ii. මුලකුරුවලින් හැඳින්වෙන නම :...............................................................................

02. ලිපිනය :

i. කාර්යාලීය ලිපිනය :...............................................................................................
ii. පුද්ගලික ලිපිනය :...............................................................................................

03. දුරකතන අංකය :

i. රාජකාරි :..................................................................................................

ii. පෞද්ගලික :.......................................................................................... ජංගම :........................................................................

04. උපන් දිනය :..................................................................................................................

2019.06.14 දිනට වයස : අවුරුදු :............................, මාස :............................ දින :............................

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

06. ස්ත්‍රී/පුරුෂ භාවය :..................................................................................................

07. තක්සේරුකරු තනතුරට පත් වූ දිනය :..................................................................................................

08. දැනට දරන තනතුර :....................................................................................................................................................................................

එම තනතුරට පත් කළ දිනය :..................................................................................................

09. එම තනතුරේ සේවා කාලය :..................................................................................................

10. තම සේවා කාලය තුළ කුමන හෝ අවස්ථාවක තමාට විරුද්ධව විනයානුකූල පියවර ගෙන තිබේද? :................................................
එසේ නම් ඒ පිළිබඳ විස්තර :....................................................................................................................................................................

මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවරැදි බැව් සහතික කරමි.

..........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..................................

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

ඉහත තොරතුරු සඳහන් ......................................................................... මයා/මිය ................................................................ කාර්යාලයේ සේවය කරන බවද ඔහු/ඇය ගේ සේවය සතුටුදායක බව ද, මෙම තනතුර සඳහා ඔහු හෝ ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දරන තනතුරෙන් මුදාහැරිය හැකි බවද සහතික කරමි.

.........................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නිල මුද්‍රාව :..................................................

දිනය :..................................

06-909

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.